පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු.ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 79

நிறுவனத்தின் பெயர்: முதலீட்டு மேம்பாட்டு அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 79

Name of the Institution : Ministry of Investment Promotion

Submission of observations of the Hon.Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

පළමු කොටස

අනු අංකය	කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩු පාඩු	අඩුපාඩු /වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග
01.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයේ සිට අවදානම් ලේඛනයක් පවත්වාගෙන යාම ආරම්භ කරන ලදී.
02.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුනද පසු වර්ෂයන්හි ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමත කර යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
03.	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොසිටි අතර 2023 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර විගණන කළමනාකරණ කමිටු නියමිත පරිදි පවත්වා ගෙන යනු ලබයි.
04.	2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයන්හි අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත.
05.	2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයේ වත්කම් නිලධාරියකු පත් කර ඇත.
06.	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයන්හි අදාළ කාල රාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.

07.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් ලබා දෙන ලද නිර්දේශ සඳහා නියමිත කාල රාමුව තුළ ක්‍රියාමාර්ග ගෙන ඇත.
08.	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	සියලුම වාහනවල අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
09.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයන්හි අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
10.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු කරමින් ඇත.
11.	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයෙන් පසු වර්ෂයන්හි අදාළ අක්මුදල් සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

දෙවැනි කොටස :

අනු අංකය	කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩු පාඩු	අඩුපාඩු/වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග
01.	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යනු ලබයි.
02.	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අමාත්‍යාංශය සඳහා මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කර මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කර ඇති අතර තවදුරටත් එහි වැඩි දියුණු කිරීම් සිදු කර ගෙන යනු ලබයි.
03.	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර ගෙන යනු ලබයි.

04.	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.
05.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්මක් නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර ගෙන යනු ලබයි.
06.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛවලට යටත්ව සැලසුම් ගත පරිදි නිලධාරීන් වෙත පුහුණු අවස්ථාවන් ලබා දීමට කටයුතු කරමින් පවතී.
07.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	මාණ්ඩලික නිලධාරීන් සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම සම්පූර්ණ කර ඇති අතර අනෙකුත් නිලධාරීන්ගේ කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත කරමින් පවතී.
08.	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඇත.
09.	සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛ අංක 3/2022 ප්‍රකාරව සැලසුම් ගත පුහුණු අවස්ථා සියල්ලම ලබා දීමට නොහැකි වූ අතර වර්තමානයේ දී සැලසුම් ගත පරිදි නිලධාරීන් වෙත පුහුණු අවස්ථාවන් ලබා දීමට කටයුතු කරමින් පවතී.

.....

රනිල් වික්‍රමසිංහ
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය